# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.08 පැය 1305 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 32 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අධිකරණ නියෝගයක් දැනුම් දීම.**

2025.01.08 වන අද දින විරෝධතාකරුවන් පිරිසක් කොටුව පොලිස් වසමේ විරෝධතාවක් පැවැත්වීමට නියමිත බවට ලද තොරතුරක් මත අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සඳහන් වග උත්තරකරුවන් වන,

1. විතාරණගේ මදුෂාන් චන්ද්‍රජිත් ( අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු )
2. පූජ්‍ය මැදිරිගිරියේ ඉස්සරධම්ම හිමි ( අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු )
3. ආර්.ඒ රශ්මික චමෝද් රණසිංහ ( වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරි කමිටුවේ කැඳවුම්කරු)
4. උදාර රණසිංහ ( නාවල විවෘත විශ්ව විද්‍යාලයේ මහ ශිෂ්‍ය සංගමයේ සභාපති )
5. තරුෂාන් පියුමන්ත හේරත් ( සම සෞඛ්‍ය විද්‍යා පීඨ ශිෂ්‍ය සමගමයේ සභාපති )

ඇතුළු ඔවුන්ගේ සාමාජිකයින් හා සහභාගී වන වෙනත් තැනැත්තන් වෙත 2025.01.08 වන දින පැය 1300 ත් පැය 1800 ත් අතර කාලයේදී කොටුව පොලිස් වසමේ සෙරමික් හන්දිය සිට එන්.එස්.ඒ වටරවුම දක්වාද, එන්.එස්.ඒ වටරවුමේ සිට බාලදක්ෂ මාවත දක්වා ගාලු පාරද, අවහිර නොකරන ලෙසත් මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, මහ බැංකුව, ජනාධිපති මන්දිරයට ඇතුළු වීම වළකින ලෙසත්, පොදු හා පුද්ගලික දේපල වලට හානි නොකරන ලෙසටත් ආඥාවක් නිකුත් කර ඇත.

මෙම ආඥාව කඩ කිරීම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 185 වගන්ති ප්‍රකාරව දඬුවම් ලැබිය හැකි වරදක් වනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**